සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ''මම සසර දුකට මුල්වන පංචස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයා සසර නොයෙක් ජාතිවල ඇවිද්දෙමි. එහෙත් දක්නට නොලැබිණි. දැන් මම ඒ වඩුවා දිටිමි....'' බුදුනු් වහන්සේ කළ මෙම ප්‍රකාශය අනුව උන්වහන්සේ දුටු වඩුවා වන්නේ,
    (1) නීවරණ ධර්මයන් ය. (2) සතර අගතීන් ය.
    (3) තණ්හාව ය. (4) දස කෙළෙස් ය.

02. විවිධ අරමුණු කෙරෙහි සිත විසිරී යා නොදී එකම අරමුණක පිහිටුවා ගැනීම සඳහා ඉවහල් වන්නේ,
    (1) විපස්සනා භාවනාවයි. (2) සමථ භාවනාවයි.
    (3) ආනාපානසති භාවනාවයි. (4) බුද්ධානුස්සති භාවනාවයි.

03. කිසියම් කාර්යයක ආරම්භය, පවත්වාගෙන යාම හා අවසානය යන කවර අවස්ථාවක වුව ද එල්ලවන අභියෝග ජය ගැනීම සඳහා නිරන්තරයෙන් ම පුරුදු පුහුණු කරගත යුතු ගුණධර්ම වන්නේ,
    (1) කරුණාව සහ දයාවයි. (2) ප්‍රඥාව සහ කරුණාවයි.
    (3) මනා අවබෝධය සහ අධිෂ්ඨානයයි. (4) ඉවසීම සහ දයාවයි.

04. උදය බමුණාගේ ආරාධනයෙන් බුදුරදුන් ඇතුළු ශ්‍රාවක පිරිස ඉතා දුකසේ යව සහලින් යැපෙමින් වේරාංජාපුර ගත කළේ,
    (1) 10 වස් කාලයයි. (2) 9 වස් කාලයයි. (3) 16 වස් කාලයයි. (4) 12 වස් කාලයයි.

05. පැරණි ශ්‍රී ලංකාවේ බුදු පිළිම නෙලූ ශිල්පීන්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ,
    (1) බුදුන් වහන්සේගේ රූප සෞන්දර්යය දැක්වීමයි.
    (2) මහා පුරුෂ ලක්ෂණ විදහා පෑමයි.
    (3) මහා කරුණාව වැනි උත්තරීතර මානුෂික ගුණාංග නිරූපනය කිරීමයි.
    (4) දේවත්වය ඉස්මතු කිරීමයි.

06. ශාසන මාමක භානක තෙරුවරුන් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටක ධර්මය ලක්දිව ග්‍රන්ථාරූඪ කිරීම සිදු වූ ධර්ම සංගායනාව හඳුන්වන්නේ,
    (1) ප්‍රථම ධර්ම සංගායනාව යනුවෙනි. (2) දෙවන සංගායනාව යනුවෙනි.
    (3) තුන්වන සංගායනාව යනුවෙනි. (4) අලුවිහාර සංගායනාව යනුවෙනි.

07. පස්වග තවුසන් රහත්වීම උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ පළමු සූත්‍ර දේශනාව වන්නේ,
    (1) දම්සක් පැවතුම් සූත්‍රයයි. (2) අනත්ත ලක්ඛණ සූත්‍රයයි.
    (3) පත්තකම්ම සූත්‍රයයි. (4) සිගාලෝවාද සූත්‍රයයි.

08. බුදුරදුන් උදෙසා ශාසනයට පූජා කළ පළමු ආරාම පූජාව වන්නේ,
    (1) වේළුවනාරාමයයි. (2) ජේතවනාරාමයයි.
    (3) පූර්වාරාමයයි. (4) රාජිකාරාමයයි.

09. කුස පුරා ආහාර අනුභව කිරීමෙන් පසු ශාරීරික අපහසුතාවයෙන් යුතුව ධර්ම ශ්‍රවණයට පැමිණි බුද්ධකාලීන භාරතීය රාජ්‍ය නායකයා වූයේ,
(1) චණ්ඩපජ්ජෝත රජතුමා ය. (2) අජාසත් රජතුමා ය.
(3) කොසොල් රජතුමා ය. (4) බිම්බිසාර රජතුමා ය.

10. ''ස්වාමීනි අපි පස්කම් සුව අනුභව කරමින් අඹුදරුවන් නිසා වන කරදර සහිත ව ගිහි ගෙදර වාස කරමි. කසි රට සුවඳ පරිභෝග කරමු. මල්ගඳ විලවුන් භාවිතා කරමු. ස්වාමීනි මෙසේ ජීවත්වන අපට මෙලොව හිතසුව පිණිස උපකාර වන්නා වූ ධර්මයක් දේශනා කරන සේක්වා'' යි බුදුන් වහන්සේගෙන් මෙසේ අයද සිටියේ,
(1) සිගාල ගෘහපති පුත්‍රයා ය. (2) කාලාමවරුන් ය.
(3) දීඝජාණු කෝලිය පුත්‍රයා ය. (4) කසිභාරද්වාජ බ්‍රාහ්මණයා ය.

11. ක්‍රි.ව. 1906 ජනවාරි 8 වනදා පාසල් අධ්‍යාපනය නතරකර, පැවිදි දිවියට ඇතුළත් වූ රුබෙල් ගුණවර්ධන දරුවා පසුව ජනාදරයට පත්වූයේ,
(1) හික්කඩුවේ සුභූති හිමි යනුවෙනි. (2) රේරුකානේ චන්දවිමල හිමි යනුවෙනි.
(3) නා උයනේ අරියධම්ම හිමි යනුවෙනි. (4) බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි යනුවෙනි.

12. ලක්දිව සාහිත්‍ය ඉතිහාසයේ කීර්තිමත් රාජ්‍ය පාලන යුගයක් ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ ලියවුණු සාහිත්‍ය කෘති තුනක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය, අමාවතුර
(2) කාව්‍යශේඛරය, ලෝවැඩ සඟරාව, බුත්සරණ
(3) කව්සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය
(4) ලෝවැඩ සඟරාව, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය

13. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ගිලන් වූ විට බුදුරජාණන් වහන්සේ පිප්ඵලි ගුහාවට වැඩමකර දේශනා කළ වදාළේ,
(1) චතුරාර්ය සත්‍ය දේශනාවයි. (2) ගිරිමානන්ද සූත්‍ර දේශනාවයි.
(3) සප්ත බොජ්ඣංග සූත්‍ර දේශනාවයි. (4) අටානාටිය සූත්‍ර දේශනාවයි.

14. බුදුරජාණන් වහන්සේ අගය කළ සිතීමේ හා විමසීමේ නිදහස වඩාත් ප්‍රකටවන අවස්ථා දෙක ලෙස දැක්විය හැක්කේ,
(1) උපාලි ගෘහපතියා හා නිගණ්ඨනාථපුත්ත හමුවීම ය.
(2) කොසොල් රජතුමා හා කේස පුත්ත ගම්වැසියන් හමු වූ අවස්ථාව ය.
(3) මහධන සිටුවරයා හා උපාලි සිටුවරයා හමු වූ අවස්ථාව ය.
(4) උපාලි ගෘහපතියා හා කාලාම වැසියන් හමු වූ අවස්ථාව ය.

15. ජීවමාන බුදුරදුන් දවස උන්වහන්සේ ළඟින්ම ඇසුරු කරමින් සිට ජීවිතයේ අවසාන කාලයේ අසරණව අම්බලමක අවසන් හුස්ම හෙලූ රජතුමා වනුයේ,
(1) සේනිය බිම්බිසාර රජතුමා ය. (2) අජාසත්ත මහ රජතුමා ය.
(3) චණ්ඩපජ්ජෝත රජතුමා ය. (4) පසේනදි කෝසල රජතුමා ය.

16. බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන විට උන්වහන්සේ හමුවට එන තෝදෙය්‍ය සුභ තරුණයාට බුදුරජාණන් වහන්සේ පෙන්වාදුන් පුද්ගල විෂමතාවන්ට හේතුවන සංඛ්‍යාව,
(1) 12 කි. (2) 13 කි. (3) 15 කි. (4) 14 කි.

17. අපමහා බෝසතාණන් වහන්සේ දස පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන ජාතක කථා අතරින් උපෙක්ඛා පාරමිතාව පිරූ අයුරු දැක්වෙන ජාතක කථාව වන්නේ,
(1) ලෝමහංස ජාතකයයි. (2) සස ජාතකයයි.
(3) මහා කපී ජාතකයයි. (4) වට්ටක ජාතකයයි.

18. ආනන්ද හිමි විසින් යම් ධර්මයක් දේශනා කරන ලද නම් යම් පනවන ලද යම් ධර්මය හා විනය මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ යයි වදාරන ලදී. මේ ප්‍රකාශය ඇතුළත් අනුදේශනාව වන්නේ,
(1) මහා සුදර්ශනා සූත්‍රයයි. (2) චූල්ලකම්ම විභංග සූත්‍රයයි.
(3) මහා පරිනිර්වාණ සූත්‍රයයි. (4) ආලවක සූත්‍රයයි.

19. ජලයෙහි පාසි ඇත්නම් එතුළ කිසිවක් නොපෙනේ. එමෙන්ම සිතෙහි කයෙහි නිදිමත ගතිය උදාසීකම පවතීනම් එය,
(1) ථීන මිද්ධ ය. (2) ව්‍යාපාද ය. (3) උද්දච්ච කුක්කුච්ච ය. (4) විචිකිච්චා ය.

20. ක්‍රි.පූ. 3 වන සියවසේදී ලක්දිව ආලෝකමත් කරමින් දුමින්දාගමනය සිදුවිය. දුමින්දාගමනය සිදුවූයේ,
(1) පොසොන් පුරපසලොස්වක පෝය දින දී ය.
(2) උඳුවප් පුරපසලොස්වක පෝය දින දී ය.
(3) වෙසක් පුරපසලොස්වක පෝය දින දී ය.
(4) දුරුතු පුරපසලොස්වක පෝය දින දී ය.

21. ගෞතම බුදු සසුනේ ධර්ම සේනාධිපති ලෙස අගතනතුර ලැබූයේ,
(1) ආනන්ද මහ රහතන් වහන්සේ ය. (2) මුගලන් මහ රහතන් වහන්සේ ය.
(3) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය. (4) සැරියුත් මහ රහතන් වහන්සේ ය.

22. රාජ්‍ය පාලකයෙකු රට වැසියන් තම දරුවන් සේ සලකමින් රාජ්‍ය පාලනය දැහැමිව පවත්වාගෙන යා යුතු බව දේශනා කර ඇත්තේ,
(1) අරුණවතී සූත්‍රයෙනි. (2) මධුර සූත්‍රයෙනි.
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙනි. (4) චක්කවර්ති සීහනාද සූත්‍රයෙනි.

23. ධර්ම විනය පිළිබඳව විශාරදයෙකු වූ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් **නොවන්නේ,**
(1) මුනිගුණ අලංකාරයයි. (2) සාරාර්ථ සංග්‍රහයයි.
(3) සතර බණවර සන්නයයි. (4) මුවදෙව්දාවතයි.

24. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ලක්දිව උපසම්පාද විනය කර්මය නැවත ආරම්භ කිරීම සඳහා භික්ෂූන් එවන ලෙස දක්වා දූතයන් යවන ලද්දේ,
(1) චීන දේශයටයි. (2) සියම් දේශයටයි. (3) බුරුම දේශයටයි. (4) භාරත දේශයටයි.

25. ලද දෙයින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, සැහැල්ලු පැවතුම් ඇති වීම, යන කරුණු තුන සරල, චාම් ජීවිතයකට අවශ්‍ය ගුණ ධර්ම තුනක් ලෙස දැක් වේ. ඒවා පිළිවෙලින් දැක්විය හැක්කේ,
(1) සන්තුට්ඨී, සුභර, සල්ලහුකවුත්ති ලෙසය. (2) සන්තුට්ඨී, සුභර, මුදු ලෙසය.
(3) සුභර, සල්ලහුකවුත්ති, සන්තුට්ඨී ලෙසය. (4) උජු, මුදු, අනතිමානී ලෙසය.

26. අප බුදුරජාණන් වහන්සේ පාරමී දම් පුරන සමයේ හෙවත් බෝධිසත්ත්ව අවධියේදී උපන් ආත්ම භව පිළිබඳ විස්තර ඇතුළත් පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා කරනු ලැබුවේ,
(1) දඹදෙණි යුගයේදී ය. (2) කුරුණෑගල යුගයේදී ය.
(3) පොළොන්නරු යුගයේදී ය. (4) ගම්පොළ යුගයේදී ය.

27. බුදු දහම නැමැති උතුම් දායාදය ලක්දිව ප්‍රචාරය කරලීම සඳහා ඉදිකරන ලද ප්‍රථම ථේරවාදී බෞද්ධ මූලස්ථානය ලෙස සැලකෙන්නේ,
(1) අභයගිරි විහාරයයි. (2) ජේතවන විහාරයයි.
(3) මහා විහාරයයි. (4) මිහින්තලා විහාරයයි.

28. මෙලොව ජීවිතය සැපවත් කර ගැනීමට නිවැරදි, දැහැමි රැකියාවක් කිරීම 'අනවජ්ජානි කම්මානි' යනුවෙන් දේශනා කර ඇති සූත්‍ර දේශනාව වන්නේ,
(1) මංගල සූත්‍රයයි. (2) අනන්ත සූත්‍රයයි. (3) පත්තකම්ම සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

29. මෙලොව, පරලොව දෙලොව අභිවෘද්ධියට හේතු වන යුතුකම් හා වගකීම් ඇතුළත් ගිහි විනය සූත්‍ර දේශනාව වන්නේ,
(1) මහා මංගල සූත්‍රයයි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

30. බෞද්ධයෝ උපතේ සිට මරණය දක්වා ම සියළු ම සුවිශේෂී අවස්ථාවලදී සංඝ රත්නයේ ආශිර්වාද මධ්‍යයේ කටයුතු කරන අතර ගැබිණි මාතාවකට ආශිර්වාද ලබා ගැනීම සඳහා සංඝ රත්නය මාර්ගයෙන් සජ්ඣායනා කරවා ගනු ලබන පිරිත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍ර දේශනාවයි. (2) පරාභව සූත්‍ර දේශනාවයි.
(3) අංගුලිමාල සූත්‍ර දේශනාවයි. (4) දස දම්ම සූත්‍ර දේශනාවයි.

31. හෙල බොදු සිරිතින් පෝෂණය වූ ථූපවංශය නම් ග්‍රන්ථයෙහි අන්තර්ගත වූයේ,

(1) සාහිත්‍ය කෘති පිළිබඳව විස්තරයයි.

(2) ජයසිරිමා බෝධීන් වහන්සේ පිළිබඳව විස්තරයයි.

(3) රුවන්වැලි සෑරදුන්ගේ විස්තරයයි.

(4) ථේරවාදී බුදුදහම පිළිබඳව විස්තරයයි.

32. ''බමුණ මමද මගපෙන්වන්නෙක්මි. මගෙන් පාර අසාගන්නා සමහරු ඒ නිවැරදි මග ගොස් නිවන් ලබාගනිති. සමහරු ඒ මඟ තිබියදී වෙනත් මං ඔස්සේ ගමන් කොට අතර මං වෙති.'' මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ බුදුන් වහන්සේගේ,

(1) භගවා ගුණයයි. (2) සුගත ගුණයයි. (3) ලෝකවිදූ ගුණයයි. (4) සත්ථා ගුණයයි.

33. කථාවත්ථුප්‍රකරණය අභිධර්ම පිටකයට එකතු කරන ලද්දේ,

(1) හතරවන ධර්ම සංගායනාවේදී ය. (2) දෙවන ධර්ම සංගායනාවේදී ය.

(3) තුන්වන ධර්ම සංගායනාවේදී ය. (4) පළමුවන ධර්ම සංගායනාවේදී ය.

34. ද්වේශය, වෛරය, ක්‍රෝධය ආදී සිතුවිලි වලින් බැහැරව මෙත්තා සිතුවිලිවලින් වාසය කිරීම ධර්මානුකූලව හඳුන්වන්නේ

(1) නෙක්කම්ම සංකප්ප නමිනි. (2) අවිහිංසා සංකප්ප නමිනි.

(3) අව්‍යාපාද සංකප්ප නමිනි. (4) සම්මා සංකප්ප නමිනි.

35. ''කෑමට ආහාර බෙදාගත යුත්තේ තමන්ට සෑහෙන ප්‍රමාණයට ය. ළිං පොකුණු ආදිය ජනතාව පොදුවේ පරිහරණය කරන තැන් අපිරිසිදු නොකර තම ප්‍රයෝජනය සඳහා ගත යුතුය. අනවශ්‍ය ලෙස විදුලිය අපතේ හැරීම ජාතික සම්පතක් අපතේ හැරීමකි.'' මෙම ප්‍රකාශයෙන් අවධාරණය කෙරෙන්නේ,

(1) ජාතික සම්පත් සුරකීමේ වටිනාකමයි.

(2) පොදු දේපල සුරකීමේ අවශ්‍යතාවයි.

(3) අරපිරිමැස්මෙන් කටයුතු කිරීමයි.

(4) තමන්ට ගැළපෙන ආකාරයට කටයුතු කිරීමේ අවශ්‍යතාවයි.

36. දෛනිකව අප සෑම දෙනා මුහුණ දෙන ගැටලු නිවැරදිව හඳුනාගැනීමට ද එම ගැටලු විසඳා ගැනීමටද මහෝපකාරීවන ධර්මතාවය වන්නේ,

(1) අටලෝ දහමයි. (2) චතුරාර්ය සත්‍යයයි.

(3) කර්මය හා පුනර්භවයයි. (4) හේතුපලවාදයයි.

37. සිදුහත් කුමරු රජකුමරෙකුට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර පිළිබඳව අධ්‍යාපනය ලැබුවේ,

(1) අසිත තවුසාගෙනි. (2) සර්ව මිත්‍ර පඬිවරයාගෙනි.

(3) දිසාපාමොක් ආචාර්යවරයාගෙනි. (4) ආලාරකාලාම තාපසතුමාගෙනි.

38. දෙවන ධර්ම සංගායනාවට දායකත්වය ලබා දෙමින් මූලිකව කටයුතු කළේ,

(1) අජාසත්ත රජතුමාය. (2) ධර්මාශෝක රජතුමාය.

(3) කාලාශෝක රජතුමාය. (4) මහා කණිෂ්ක රජතුමාය.

39. ශ්‍රේෂ්ඨ නායකයකු තුළ පැවතිය යුතු වැදගත් ලක්ෂණ වන්නේ අනුශාසනයෙන් පමණක් නොව ආදර්ශයෙන්ද මග පෙන්වීමයි. බුදුසිරිතෙන් මෙම ගුණය වඩාත් ප්‍රකට වන්නේ,

(1) මග්ගක්ඛායි ගුණයෙනි. (2) අක්ඛාතාර ගුණයෙනි.

(3) යථාවාදි තථාකාරි ගුණයෙනි. (4) සත්ථා දේව මනුස්සානං ගුණයෙනි.

40. ''ඇවැත්නී, ශෝක නො වන්න, නො වැළපෙන්න, ඒ මහා ශ්‍රමණයාගෙන් අපි මිදුණෝ වෙමු.'' බුදුරජාණන් වහන්සේ පිරිනිවීමෙන් පසු මෙසේ ප්‍රකාශ කළේ,

(1) සුනක්ඛත්ත භික්ෂුව විසිනි. (2) දේවදත්ත භික්ෂුව විසිනි.

(3) සුභද්ද භික්ෂුව විසිනි. (4) ධම්මාරාම භික්ෂුව විසිනි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) i. සිව්සස් දහම් අවබෝධකර ගැනීමට මුල්වන ප්‍රඥා කොටසට අයත් ප්‍රධාන මාර්ග අංග දෙක නම් කරන්න.

ii. ''විනයෝ නාම සාසනස්ස ආයු'' යන්නෙහි අර්ථය ලියන්න.

iii. සමස්ත බෞද්ධ ලෝකයා හඬවමින් ක්‍රි.ව. 1933 අප්‍රේල් 29 වන සම්බුදු සසුන බේරාගැනීමට තවත් විසිපස් වතාවක් ඉපදේවායි ප්‍රාර්ථනා කරමින් අපවත් වූ ශ්‍රේෂ්ඨ ලාංකික භික්ෂුව කවුරුන් ද?

iv. ''දූරං ගමං එකචරං අසරීරං ගුහාසයං......'' යන ගාථා පාඨය සම්පූර්ණ කරන්න.

v. මහනුවර යුගයේ චිත්‍ර කලාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

vi. බුදුරජාණන් වහන්සේට මුහුණ දීමට සිදුවූ අභියෝග දෙකක් නම් කරන්න.

vii. කායික රෝග හට ගැනීමට මුල්වන හේතු දෙකක් නම් කරන්න.

viii. පත්තකම්ම සූත්‍රයේ අන්තර්ගත පංච බලි සමාජ ප්‍රගමනයට වැදගත්වේ. ඒවායින් දෙකක් නම් කරන්න.

ix. සිහිය පිහිටුවා ගැනීමට උපකාරවන සතර සතිපට්ඨාන ධර්මයන්ගෙන් දෙකක් නම් කරන්න.

x. රුවන්වැලි මහා සෑ රදුන්ගේ වර්ණවත් විස්තරයක් ථූපවංශයේ ඇතුළත්වේ. එම ග්‍රන්ථය රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) i. සිදුහත් බෝසතුන්ගේ ශිෂ්‍ය ජීවිතයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

ii. ජීවිතයේ අභියෝග ජය ගැනීමට බුදු සිරිතෙන් ගත හැකි ආදර්ශ (ගුණාංග) හයක් නම් කරන්න.

iii. අභියෝග ජය ගැනීමට සත්‍ය වචනයේ බලය හා විමර්ශනශීලී වීම අවශ්‍ය බව බුද්ධ චරිතය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) i. අණන සූත්‍රයේ සඳහන් වන ආකාරයට චතුර්විධ සැප නම් කරන්න.

ii. ඉන් ඔබ කැමති එක් සැපයක් සැකවින් දක්වන්න.

iii. රැකියාවක ධාර්මිකත්වය ආරක්ෂා කිරීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) i. බුදු දහමේ ආභාෂයෙන් පෝෂණය වූ දඹදෙණි යුගයේ රචිත කෘති දෙකක් නම් කරන්න.

ii. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් නම් කරන්න.

iii. බෞද්ධ සාහිත්‍ය කෘති සංරක්ෂණය සඳහා ඔබට දායකවිය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) i. අනන්ත ලක්ඛණ සූත්‍රයේ සඳහන් ත්‍රි ලක්‍ෂණ නම් කරන්න.

ii. පංච අභිඥා, අෂ්ට සමාපත්ති ලැබීමට මෙන්ම ජීවිතයෙහි යථාතත්ත්වක් අවබෝධයට හේතුවන ප්‍රධාන භාවනා ක්‍රම දෙක ලියා දක්වන්න.

iii. වර්තමාන සිසුන් විවිධ ගැටලු ප්‍රශ්නවලට මැදිවී අධ්‍යාපන කටයුතු අසාර්ථක කරගැනීම සුලභව දකින්නට ලැබෙන්නකි. එයින් මිදීමට භාවනාව උපයෝගී කරගත හැකි අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) i. පුද්ගලයෙකු ගුණගරුක අයෙකු බවට පත්කිරීමට මහෝපකාරී වන සතර බ්‍රහ්ම විහරණ අනුපිළිවෙලින් නම් කරන්න.

ii. එයින් ඔබ කැමති එක් බ්‍රහ්ම විහරණයක් සැකවින් දක්වන්න.

iii. තමා තුළ නායකත්ව ලක්‍ෂණ ගොඩනගා ගැනීමේදී බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඉවහල් කරගත හැකි අන්දම පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව ii. රේරුකානේ චන්දවිමල නාහිමි

iii. අෂ්ටලෝක ධර්ම iv. බුද්ධකාරක ධර්ම

(ලකුණු 2 + 3 + 5 = 10)

The National e-learning Portal for The General Education

**පිළිතුරු - I පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(3) | 4 -(4) | 5 -(3) | 6 -(4) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10 -(3) |
| 11-(2) | 12-(4) | 13-(3) | 14-(4) | 15-(4) | 16-(4) | 17-(1) | 18-(3) | 19-(1) | 20-(2) |
| 21-(4) | 22-(4) | 23-(4) | 24-(2) | 25-(3) | 26-(2) | 27-(3) | 28-(1) | 29-(3) | 30-(3) |
| 31-(3) | 32-(4) | 33-(3) | 34-(3) | 35-(3) | 36-(4) | 37-(2) | 38-(3) | 39-(3) | 40-(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය**

(01) i. සම්මා දිට්ඨි සම්මා සංකප්ප
ii. ශාසනයේ ආයුෂය විනයයි.
iii. සිරිදේව මිත්ත ධම්ම පාල හිමි
iv. යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාර බන්ධනා
v. ● ඇස පිනවන සුළු දෘෂ්‍ය ගෝචර රටාවකින් යුක්ත වීම. සෑම රූපයකම පැති පෙනුමකින් නිර්මාණය කර තිබීම. ● පළමුවෙන් රූපවල බාහිර රේඛා ඇඳ වර්ණ යොදා සම්පූර්ණ කර තිබීම. (ආදී කරුණු ඇතුළත් කර ඇත්නම් සමස්තය සලකා ලකුණු දෙන්න.)
vi. සත්සතිය ගතකිරීම යන / ප්‍රථම ධර්ම දේශනය / තනතුරු ප්‍රදානය
vii. ශරීරය පිත ධාතුව කිපීමෙන් වැළදෙන රෝග / සෙම ධාතුව කිපීමෙන් වැළදෙන රෝග / වාතය කිපීමෙන් වැළදෙන රෝග
viii. ඥාතිබලි, අත්ථිබලි, පුබ්බපේතබලි, රාජබලි, දේවතා බලි
ix. කායානුපස්සනා වේදනානුපස්සනා
x. විද්‍යාචක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත

(ලකුණු 02 × 10 = 20)

(02) i. ඥාතීන් ඉදිරියේදී ශිල්ප දැක්වීම / අසන දකින දේ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම / ජීවිතයේ යථාර්ථයට මුහුණ දීමට නොබියව ඉදිරිපත්වීම.
ii. විමසුම්ශීලී බුද්ධිය, අධිෂ්ඨානය, ඉවසීම, ආත්ම සංයමය, නොපසුබස්නා උත්සාහය, උපායශීලී බව
iii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) i. අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛ
ii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.
iii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) i. දම්සරණ, සඟසරණ, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය, සිදත් සඟරාව
ii. සිතුම් පැතුම් ආකල්ප වර්ධනය කරගත හැකිවීම. / නොදියුණු ආකල්ප වර්ධනය කරගත හැකිවීම. / උදාර ගුණාංග ඇති කරගැනීම. සහ ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.
iii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) i. අනිත්‍යය, දුක්ඛ, අනාත්ම
ii. සමථ භාවනාව හා විදර්ශනා භාවනාව
iii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) i. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා
ii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.
iii. ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) ලියා ඇති පිළිතුරෙහි සමස්තය සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 10)